**ශ්‍රී ලංකා මහ බැංකුව (ශ්‍රීලංමබැ) - 2015**

**-------------------------------------------------**

2015 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා ආදායම් ප්‍රකාශනය, විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති හා අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ශ්‍රී ලංකා මහ බැංකුවේ (ශ්‍රීලංමබැ) මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ මුදල් නීති පනතේ 42(2) වගන්තිය (422 අධිකාරය) සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මෙම විගණනය සිදු කිරීමේදී ජාත්‍යන්තර මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලවීම පරීක්ෂා කිරීම සඳහා ප්‍රසිද්ධ වෘත්තියෙහි නියැලි වරලත් ගණකාධිකාරී සමාගමක් මට සහාය විය.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

----------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ජාත්‍යන්තර මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතිවලට (IFRS) අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

-----------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාරධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාලවන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ශ්‍රී ලංකා මහ බැංකුවේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් බැංකුවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 2. මූල්‍ය ප්‍රකාශන

------------------

### 2.1 මතය

--------

මූල්‍ය ප්‍රකාශනවලින් 2015 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා මහ බැංකුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ජාත්‍යන්තර මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්

----------------------------------------

#### 2.2.1 ගිණුම්කරණ අඩුපාඩු

-----------------------

පෙර වර්ෂය සඳහා උපචිත වියදම් රු.244,253,125 කින් වැඩියෙන් දක්වා තිබූ අතර එම දෝෂය අදාළ වියදම් ගිණුම්වලට එරෙහිව ගැලපීම් කිරීම වෙනුවට සමාලෝචිත වර්ෂය සඳහා විවිධ ආදායමට බැර කර තිබුණි.

#### 2.2.2 මහා භාණ්ඩාගාරයෙන් හා වෙනත් අමාත්‍යාංශවලින් ලැබිය යුතු මුදල්

---------------------------------------------------------------------------

මුදල් නීති පනතේ 39 වගන්තිය ප්‍රකාරව, ලාභය ඒකාබද්ධ අරමුදලට මාරු කිරීමට පෙර එක් එක් හිඟ ශේෂයන් අයකර ගත යුතුය. කෙසේ වුවද ලාභය ඒකාබද්ධ අරමුදලට මාරු කරන අවස්ථාවේදී අයකර ගැනීමෙන් තොරව සමාලෝචිත වර්ෂය අවසානයට රු. 1,378,694,800 ක මුදලක් හිඟ හිට පැවතුණි. එක් එක් වර්ෂය සඳහා හිඟ ශේෂය පිළිබඳ සාරාංශය පහත පරිදි වේ.

| වර්ෂය | හිඟ ශේෂය |
|---|---|
| | රු. |
| 2010 ට පෙර | 3,131,503 |
| 2010 | 1,311,774,231 |
| 2011 | 16,851,378 |
| 2012 | 21,374,392 |
| 2013 | 2,165,825 |
| 2014 | 3,441,143 |
| 2015 | 19,956,328 |
| **එකතුව** | **1,378,694,800** |

### 2.3 නීති,රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම

---------------------------------------------------------------------------

2016 අප්‍රේල් 29 දිනැති අංක 03/2016 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයට පටහැනිව ශ්‍රී ලංකා මහ බැංකුව විසින් එහි සේවකයන්ගෙන් අයකර ගැනීම වෙනුවට ස්වකීය අරමුදල් වලින් උපයන විට ගෙවීම් බදු (PAYE) හා බදු මත බදු එකතුව රු. මිලියන 322.6 ක් හා රු. මිලියන 179.2 ක් පිළිවෙලින් සමාලෝචිත වර්ෂය සඳහා සහ පෙර වර්ෂය සඳහා ගෙවා තිබුණි.

## 3. මූල්‍ය සමාලෝචනය

## 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂය සඳහා ශ්‍රී ලංකා මහ බැංකුවේ මෙහෙයුම් ප්‍රතිඵලය බදු වලට පෙර රු. මිලියන 17,814 ක ශුද්ධ පාඩුවක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ බදු වලට පෙර ශුද්ධ පාඩුව රු. මිලියන 31,532 ක් වූයෙන් සමාලෝචිත වර්ෂය සඳහා මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. මිලියන 13,718 ක වර්ධනයක් දැක්වුණි. ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ රු. මිලියන 42,001 කින් විදේශ මූල්‍ය වත්කම් වලින් ශුද්ධ වියදම වැඩිවීමට ප්‍රතිරූපීව ශුද්ධ විදේශ විනිමය ප්‍රත්‍යාගණන වාසිය හා දේශීය මූල්‍ය වත්කම් වලින් ශුද්ධ ආදායම පිළිවෙලින් රු. මිලියන 42,856 කින් හා රු. මිලියන 13,535 කින් වැඩිවීම මූල්‍ය ප්‍රතිඵලවල මෙම වර්ධනය සඳහා ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

ඉකුත් වර්ෂයේ රු. බිලියන 20.2 ක්වූ මුළු ශුද්ධ මෙහෙයුම් පාඩුවට (රු. බිලියන 32.2 ක ශුද්ධ විදේශ විනිමය ප්‍රත්‍යාගණන පාඩුව ඇතුළත්ව) සාපේක්ෂව සමාලෝචිත වර්ෂය සඳහා රු. බිලියන 10.6 ක ශුද්ධ විදේශ විනිමය ප්‍රත්‍යාගණන වාසිය ඇතුළත්ව ශ්‍රී ලංකා මහ බැංකුවේ මුළු ශුද්ධ මෙහෙයුම් පාඩුව රු. බිලියන 6.1 ක් වූයෙන් මුළු ශුද්ධ මෙහෙයුම් පාඩුවේ රු. බිලියන 14.1 ක හෙවත් සියයට 70 ක වර්ධනයක් දැක්වුණි. මේ අතර ඉකුත් වර්ෂයේ ක්ෂය හා ක්‍රමක්ෂය ඇතුළත් රු. බිලියන 11.3 ක මෙහෙයුම් වියදම් සමඟ සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ එය රු. බිලියන 11.6 ක් වූයෙන් මෙහෙයුම් වියදම් වල සියයට 2.65 ක වැඩිවීමක් දැක්වුණි. සමාලෝචිත වර්ෂය තුළ ශ්‍රී ලංකා මහ බැංකුවේ ආදායම හා වියදමට අදාළ විචලනයන් ඉකුත් වර්ෂය සමඟ සසඳා පහත දැක්වේ.

| | 2015 | 2014 | විචලනය හිතකර/(අහිතකර) | |
|---|---|---|---|---|
| | රු. බිලියන | රු. බිලියන | රු. බිලියන | ප්‍රතිශතය |
| විදේශ මූල්‍ය වත්කම්වලින් ආදායම/(වියදම) | (15.1) | 26.9 | (41.9) | (155.7) |
| විදේශ මූල්‍ය වගකීම් මත වියදම | 3.6 | 3.1 | (0.5) | (16.1) |
| විදේශ විනිමය ප්‍රත්‍යාගණන වාසිය/ (පාඩුව) | 10.6 | (32.3) | 42.9 | 132.8 |
| දේශීය මූල්‍ය වත්කම්වලින් ආදායම/(වියදම) | 0.4 | (13.1) | 13.5 | 103.0 |
| මෙහෙයුම් වියදම් | 11.6 | 11.3 | (0.3) | (2.7) |
| වර්ෂය සඳහා ශුද්ධ පාඩුව | (17.8) | (31.5) | 13.7 | 43.5 |

ඉකුත් වර්ෂයට සාපේක්ෂව විදේශ මූල්‍ය වත්කම් වලින් ආදායම සියයට 156 කින් අඩුවී තිබුණද, දේශීය මූල්‍ය වත්කම්වලින් ආදායම ඉකුත් වර්ෂයට සාපේක්ෂව සියයට 103 කින් වැඩි වී තිබුණු බැවින්, එහි ප්‍රතිඵලය වූයේ සමාලෝචිත වර්ෂය සඳහා ශුද්ධ පාඩුව අඩුවීමක් විය.

**3.3 මතභේදයට තුඩු දෙන ගනුදෙනු**

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(අ) ගොඩනැගිලි කුලියට දීම**

මුදල් නීති පනතේ 177 වගන්තිය අනුව, "ශ්‍රී ලංකා මහ බැංකුව, ස්වකීය හිමිකමක් සපුරා ගැනීමේදී අත්පත් කර ගන්නා සම්බන්ධතාවයක් හැර වෙළඳාමක හෝ වෙනත් ලෙසකින් වාණිජ, කර්මික හෝ වෙනත් ව්‍යාපාර කටයුත්තක නියැලිය නොයුතුය." මෙම විධිවිධානයට පටහැනිව ශ්‍රී ලංකා මහ බැංකුව සතු පහත සඳහන් ගොඩනැගිලි අරමුණු කළ කාර්යයන් සඳහා යොදා ගැනීමෙන් තොරව බාහිර පාර්ශවයන්ට කුලියට දී තිබුණි. විස්තර පහත දැක්වේ.

| ගොඩනැගිල්ලේ නම | කුලියට දී තිබූ කාල පරිච්ඡේදය | බාහිර පාර්ශවයේ නම | මාසික කුලිය |
|---|---|---|---|
| බ්‍රසිලයේ පිහිටි දේපල | 2015 පෙබරවාරි 01 සිට 2017 ජනවාරි 31 දක්වා | විදේශ කටයුතු අමාත්‍යාංශය | එජඩො 9,000 |
| නිව්යෝක්හි ගොඩනැගිල්ල | 2012 ජූනි 01 සිට 2017 මැයි 31 දක්වා | විදේශ කටයුතු අමාත්‍යාංශය | එජඩො 68,000 |
| වයිට්අවේස් ගොඩනැගිල්ල | | | |
| - බිම් මහල හා 1 වෙනි මහල | 2015 නොවැම්බර් 01 සිට 2018 ඔක්තෝබර් 31 දක්වා | ණය තොරතුරු කාර්යාංශය | රු. 4,140,000 |
| දෙවැනි මහල | 2015 නොවැම්බර් 01 සිට 2018 ඔක්තෝබර් 31 දක්වා | දක්ෂිණ සංවර්ධන අමාත්‍යාංශය | රු. 2,070,000 |
| නැෂනල් මියුචුවල් ඇෂුවරන්ස් ගොඩනැගිල්ලේ 4 වැනි 5 වැනි මහල් (සෙන්ට්‍රල් පොයින්ට්) | 2015 දෙසැම්බර් 01 සිට 2016 නොවැම්බර් 30 දක්වා | CHEC - කොළඹ පෝට් සිටි ලිමිටඩ් (පුද්ගලික) සමාගම | රු.5,154,087 (2016 දෙසැම්බර් 01 දින සිට රු5,540,658) |

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) බ්‍රසීලයේ පිහිටි දේපල මිලදී ගැනීමට පෙර ලබා ගත යුතු අමාත්‍ය මණ්ඩල අනුමැතිය ශ්‍රී ලංකා මහ බැංකුව විසින් මේ දක්වා ලබා ගෙන නොතිබූ අතර දේපල උපයෝජනය පිළිබඳ ඉදිරි සැලැස්ම මේ දක්වා තීරණය කර නොතිබුණි.

(ii) බ්‍රසීලයේ හා නිව්යෝක්හි පිහිටි දේපල වල අයිතිය මහා භාණ්ඩාගාරය වෙත පවරා දීමට ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය විසින් 2016 මැයි 10 දින තීරණය කර තිබුණද, මේ සම්බන්ධයෙන් තවදුරටත් ක්‍රියාමාර්ග 2016 සැප්තැම්බර් මාසය දක්වාත් ගෙන නොතිබුණි.

**(ඇ) උපදේශක සේවා සහ උපදේශක සභාව සඳහා ගෙවීම් කිරීම**

---

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ එවකට ජනාධිපතිවරයා විසින් උතුරු සහ නැගෙනහිර පළාත්වල පදිංචිව සිට අතුරුදහන් වූ පුද්ගලයින් සම්බන්ධයෙන් ලැබුණු පැමිණිලි විමර්ශනය කිරීම සඳහා පත් කරන ලද ජනාධිපති කොමිෂන් සභාවට උපදෙස් දීම සඳහා උපදේශක සභාවක් ලෙස කටයුතු කිරීමට 2014 ජූනි 28 දින ජාත්‍යන්තර විශේෂඥයින් තිදෙනෙකු පත් කරන ලද අතර මෙය 2014 ජූලි 15 දිනැති අංක 1871/18 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය මගින් නිවේදනය කරන ලදී. ඉහත උපදේශක සභාවට හා එහි කාර්ය මණ්ඩලයට උපදේශක සේවා ගාස්තු, නවාතැන් හා වෙනත් ගාස්තු වශයෙන් රු. මිලියන 145 ක් හා රු. මිලියන 111.5 ක් වූ වියදම් පිළිවෙලින් සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂය සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් දරා තිබුණි. ඉහත වියදම කිසිදු ප්‍රතිපූර්ණය කිරීමේ පදනමකින් තොරව ශ්‍රී ලංකා මහ බැංකුව විසින් දරා තිබුණද ඉහත උපදේශකවරුන්ගේ කාර්යයන් ශ්‍රී ලංකා මහ බැංකුවේ අරමුණුවලට සෘජුවම අදාළ නොවීය.

"2016 අගෝස්තු 16 සිට ශ්‍රී ලංකා මහ බැංකුව විසින් උපදේශකවරුන්ට ගෙවන ලද ඕනෑම ගෙවීමක් ඒකාබද්ධ අරමුදලට මාරු කරන ලාභයෙන් අයකර ගැනීම සඳහා 2016 නොවැම්බර් 01 දින අමාත්‍ය මණ්ඩලය විසින් අනුමැතිය ලබා දී ඇති බව" මේ සම්බන්ධයෙන් ශ්‍රී ලංකා මහ බැංකුවේ සහකාර අධිපති විසින් මා වෙත දන්වා තිබුණි.

**(ඈ) ආයෝජන ආරාවුල් නිරවුල් කිරීම සඳහා විදේශීය නීතිඥවරුන්ට සහ ආයෝජන ආරාවුල් බේරුම් කිරීමේ ජාත්‍යන්තර මධ්‍යස්ථානයට (ICSID) ගෙවීම් කිරීම.**

---

හෙජින් තෙල් ගනුදෙනුවල ප්‍රමාණාත්මක දෝෂයන් පැවතීම හා බොහෝදුරට දූෂිත වී ඇති බව සොයාගැනීම හේතුවෙන් 2008 දෙසැම්බර් 16 දින මුදල් මණ්ඩලය නිකුත් කළ උපදෙස් යටතේ ඩොයිෂ් බැංකුව AG(DB) සමඟ එළඹි හෙජින් ගිවිසුම මත ගෙවීම් කිරීමට ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාවට තහනම් කර තිබුණි. මේ අතර ශ්‍රී ලංකා රජයට එරෙහිව ඩොයිෂ් බැංකුව විසින් ආයෝජන ආරාවුල් නිරවුල් කිරීමේ ජාත්‍යන්තර මධ්‍යස්ථානයේ (ICSID) බේරුම් කිරීමේ ක්‍රියාවලිය ආරම්භ කර තිබුණි. මෙහිදී, එජඩො 78,469,623 ක මුදලක් සඳහා ඩොයිෂ් බැංකුවට වාසිදායක වන පරිදි 2012 නොවැම්බර් 02 දින තීරක ප්‍රදානය සිදුකර තිබුණි.

කෙසේ වුවද නීතිපතිවරයාගේ හා ශ්‍රී ලංකා මහ බැංකුවේ නීතිඥ කණ්ඩායමේ උපදෙස් වලට අනුව, තීරක ප්‍රදානයට එරෙහිව ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ආයෝජන ආරාවුල් නිරවුල් කිරීමේ ජාත්‍යන්තර මධ්‍යස්ථානයෙහි නිෂ්ප්‍රභා කිරීමේ ක්‍රියාවලිය ආරම්භ කර තිබුණි.

ඒ අනුව 2010 වර්ෂයේ සිට 2014 වර්ෂය දක්වා බේරුම් කිරීමේ කටයුතුවලට පෙනී සිටීමෙහි නිරත වූ විදේශීය නීතිඥවරුන්ට හා නිෂ්ප්‍රභා කිරීමේ ක්‍රියාවලිය සඳහා වන පරිපාලන පිරිවැය ලෙස ආයෝජන ආරාවුල් නිරවුල් කිරීමේ ජාත්‍යන්තර මධ්‍යස්ථානයට සමාලෝචිත වර්ෂය තුළදී පිළිවෙලින් රු.378,676,095 ක් හා රු.25,617,480 ක් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ගෙවා තිබුණි. එයට අමතර වශයෙන් මේ සම්බන්ධයෙන් රු.13,079,334 ක ප්‍රතිපාදනයක්ද ගිණුම්වල සිදු කර තිබුණි.

එකතුව රු.417,372,909 ක්වූ ඉහත ගෙවීම් ප්‍රතිපූර්ණය කිරීමේ පදනමකින් තොරව ගෙවා තිබූ අතර මෙම ගෙවීම් ශ්‍රී ලංකා මහ බැංකුවට සෘජුවම අදාළ නොවන කාර්යයන් සඳහා ගෙවීම් බව නිරීක්ෂණය විය.

ශ්‍රී ලංකා මහ බැංකුවේ සහකාර අධිපති විසින් "ඉහත සඳහන් ගෙවීම් ශ්‍රී ලංකා මහ බැංකුවේ කාර්යයන්වලට ඍජුවම සම්බන්ධ නොවන බව පෙනීයන නමුත් ලංකා ඛනිජ තෙල් සංස්ථාව විසින් ඩොයිෂ් බැංකුව වෙත මුදල් නොගෙවීම හේතුවෙන් ශ්‍රී ලංකා රජයට එරෙහිව බේරුම් කිරීමේ ක්‍රියාවලියක් ආරම්භ කර තිබූ අතර, ඒ අනුව 2008 දෙසැම්බර් 16 දින මුදල් මණ්ඩලය විසින් නිකුත් කරන ලද නියෝගයේ ප්‍රතිඵලයක් ලෙස ආයෝජන ආරාවුල් නිරවුල් කිරීමේ ජාත්‍යන්තර මධ්‍යස්ථානයේ බේරුම් කිරීමේ ක්‍රියාවලිය වෙනුවෙන් ශ්‍රී ලංකා මහ බැංකුවේ මැදිහත්වීම එම අවස්ථාවේදී අත්‍යවශ්‍ය විය." යනුවෙන් මා වෙත දන්වා තිබුණි.

**(ඇ) ප්‍රාථමික ගනුදෙනුකරුවෙකුගේ දෝෂ සහිත ක්‍රියාමාර්ගයන් හා මූල්‍ය අක්‍රමිකතා**

**------------------------------------------------------------------------------------------**

ශ්‍රී ලංකා මහ බැංකුවේ රාජ්‍ය ණය දෙපාර්තමේන්තුවේ අධීක්ෂණ අංශය විසින් 2015 මාර්තු 31 දින, 2015 මැයි 20 දින හා 2015 මැයි 21 දින ප්‍රාථමික ගනුදෙනුකරුවෙකු පිළිබඳ ස්ථානීය පරීක්ෂණයක් සිදු කරන ලදී. පරීක්ෂණ වාර්තාව 2015 සැප්තැම්බර් 14 දින මුදල් මණ්ඩලය වෙත ඉදිරිපත් කරන ලදී.

එම ස්ථානීය පරීක්ෂණයන්හිදී පහත සඳහන් රීති එම ප්‍රාථමික ගනුදෙනුකරු විසින් උල්ලංඝණය කර තිබුණු බව අනාවරණය විය.

(i) දිනය තුළ ද්‍රවශීලතා පහසුකම (Intra – day Liquidity Facility) භාවිතා කිරීම පිළිබඳ Lanka Settle System Rules Version 2.1 (2013) - දිනය තුළ ද්‍රවශීලතා පහසුකම ලබා ගැනීම සඳහා සහතික ඇපයන් ලෙස ප්‍රාථමික ගනුදෙනුකරු විසින් එහි ගනුදෙනුකරුවන්ගේ සුරැකුම් යොදාගෙන තිබුණි.

(ii) **2002 මැයි 02 දිනැති ප්‍රතිමිලදී ගැනුම් හා ප්‍රතිවර්තන ප්‍රතිමිලදී ගැනුම් ගිවිසුම් පිළිබඳ නියෝගය -** ප්‍රතිමිලදී ගැනුම් ගිවිසුම් යටතේ ගනුදෙනුකරුවන්ගෙන් ණය ගැනීම් වලට එරෙහිව ප්‍රමාණවත් සුරැකුම් වෙන් කිරීම සඳහා සහ ප්‍රතිවර්තන ප්‍රතිමිලදී ගැනුම් ගිවිසුම් යටතේ එයින් ණය ලබාදීම සඳහා ප්‍රමාණවත් වෙළඳපොළ අගයක් සහිත සුරැකුම්පත් ලබා ගැනීමට ප්‍රාථමික ගනුදෙනුකරුට නොහැකි වී තිබුණි.

(iii) **Lanka Settle System Rules Version 2.1 (2013) හි 2.2 වගන්තිය (භාරකරු වගකීම්) -** ලංකා සෙට්ල් සිස්ටම්හි මධ්‍යම තැන්පතු පද්ධතියේ (Central Depository System) සමහර ගනුදෙනුකරුවන්ගේ ගනුදෙනු සම්පූර්ණයෙන්ම වාර්තා කිරීමට ප්‍රාථමික ගනුදෙනුකරුට නොහැකි වී තිබුණි.

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් 2012 දෙසැම්බර් 10 දින හා 2012 දෙසැම්බර් 14 දින සිදු කරන ලද පෙර පරීක්ෂණයන්හිදී අනාවරණය වූ එම ප්‍රාථමික ගනුදෙනුකරු විසින් කරන ලද කඩකිරීම් (ප්‍රමාණවත් සුරැකුම්පත් ප්‍රමාණයක් ඇතැම් ගනුදෙනුකරුවන්ට වෙන් නොකිරීම හා දිනය තුළ ද්‍රවශීලතා පහසුකම (ILF) ලබාගැනීම සඳහා ගනුදෙනුකරු සුරැකුම්පත් භාවිතා කිරීම) පිළිබඳව අවවාදාත්මක ලිපි කිහිපයක් හා 2013 ජූනි 06 දින නියෝගයක්ද නිකුත් කර තිබූ බව තවදුරටත් නිරීක්ෂණය විය. ප්‍රාථමික ගනුදෙනුකරු විසින් කරන ලද අක්‍රමිකතා සම්බන්ධයෙන් හැඟවීම් බොහෝ ප්‍රමාණයක් තිබුණද, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් කිසිදු පිළියම් ක්‍රියාමාර්ගයක් නොගැනීම හේතුවෙන් 2015 වර්ෂයේදී ද මෙම ගනුදෙනුකරු විසින් එවැනි දෝෂ සහිත ක්‍රියාමාර්ගයන් දිගින් දිගටම සිදු කර තිබුණි.

තවද, මෙම ප්‍රාථමික ගනුදෙනුකරු සමග ශ්‍රී ලංකා මහ බැංකුව විසින් එහි අරමුදල් වෙළඳාම් කළ හැකි ප්‍රතිවර්ත ප්‍රතිමිලදී ගැනීම් ආයෝජනවල ආයෝජනය කර තිබුණි. වෙළඳාම් කළ හැකි උපකරණ සඳහා ඕනෑම අවස්ථාවක පාදක වූ සුරැකුම් වෙනස් කිරීමට භාරකරුට අයිතිය තිබේ. ප්‍රතිවර්තන ප්‍රතිමිලදී ගැනුම් ගිවිසුමට අනුව, පාදක වූ සුරැකුම වෙනස් කෙරෙන විට, භාරකරු විසින් සමාන සුරැකුමක් හෝ සුරැකුමේ කල් පිරීම් වටිනාකම වැඩි සුරැකුම් සැපයීමට භාරකරු බැඳී සිටී. අවලංගු කරන සුරැකුම්පත් සම්බන්ධයෙන් යළි සුරැකුම් වෙන් කිරීමට එකී ප්‍රාථමික ගනුදෙනුකරු අසමත්ව තිබූ අතර ප්‍රතිවර්තන ප්‍රතිමිලදී ගැනුම් ගිවිසුම් උල්ලංඝනය කිරීමද සිදු කර තිබුණි. කෙසේ වුවද, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් එහි අරමුදල් වෙළඳාම් කළ නොහැකි උපකරණවල ආයෝජනය කළේ නම්, ආයෝජන ගිවිසුම්වල කොන්දේසිවලට පටහැනි වන ආකාරයෙන් සුරැකුම් වෙනස් කිරීමට භාරකරුට නොහැකි වනු ඇත. මෙම ප්‍රාථමික ගනුදෙනුකරු සමග ශ්‍රී ලංකා මහ බැංකුව මගින් කරන ලද සහතික ඇප නොමැති ප්‍රති මිලදී ගැනුම් ආයෝජන වටිනාකම 2015 දෙසැම්බර් 31 දිනට රු. බිලියන 1.9 ක් විය. 2015 දෙසැම්බර් 04 දින ගන්නා ලද මුදල් මණ්ඩලයේ තීරණය ප්‍රකාරව, සහතික ඇපයක් නොමැතිව ඉහත සඳහන් ආයෝජනයන් යළි ආයෝජනය කිරීමට ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය තීරණය කර තිබුණි. ආපසු ගන්නා ලද සුරැකුම් සම්බන්ධයෙන් කිසිදු සුරැකුම් යළි පැවරීමෙන් තොරව පාදක වූ සුරැකුම්පත් ප්‍රාථමික ගනුදෙනුකරු විසින් ආපසු ගැනීම හේතුවෙන් මෙම ආයෝජනයන් සම්බන්ධයෙන් ලංකා සිකියුර් සිස්ටම් හි ශුන්‍ය ශේෂයක් දක්වා තිබුණි.

මෙම ප්‍රාථමික ගනුදෙනුකරු සමග කරන ලද රු. බිලියන 2.5 ක ආයෝජනයන් සඳහා සුරැකුම් වෙන් නොකිරීම සම්බන්ධයෙන් 2015 ඔක්තෝබර් 07 දින රාජ්‍ය ආයතනයක් විසින් ශ්‍රී ලංකා මහ බැංකුවට දන්වා තිබූ බව තවදුරටත් නිරීක්ෂණය විය.

**(ඉ) බැරපත් (Credit Card) වියදම් නිරවුල් කිරීම**

**--------------------------------------------------------**

අත්තිකාරම් ගෙවීම් සම්බන්ධයෙන් ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද 2011 අප්‍රේල් 19 දිනැති චක්‍රලේඛයේ විධිවිධාන අනුව, ලබාගත් අත්තිකාරම් නිරවුල් කිරීම සඳහා මුල් ඉන්වොයිසි ඉදිරිපත් කළ යුතුය. ඉහත සඳහන් චක්‍රලේඛ විධිවිධානවලට පටහැනිව ශ්‍රී ලංකා මහ බැංකුවේ හිටපු අධිපතිවරයා විසින් ලබා ගන්නා ලද අත්තිකාරම් නිරවුල් කිරීම සඳහා 2015 පෙබරවාරි 28 දින සිට 2015 දෙසැම්බර් 31 දක්වා කාලපරිච්ඡේදය තුළ බැරපත් මගින් ගෙවන ලද රු. 1,537,355 ක් වූ මුල් ඉන්වොයිසිපත් ඉදිරිපත් කර නොතිබුණි. කෙසේ වුවද ඉහත සඳහන් වියදම් ශ්‍රී ලංකා මහ බැංකුවට අයකර තිබුණි.

තවද, එවකට අධිපතිවරයා විසින් 2015 පෙබරවාරි 28 දින සිට 2015 දෙසැම්බර් 31 දක්වා කාල පරිච්ඡේදය තුළ නිල බැරපත් මගින් දරන ලද රු.6,564,359 ක් වූ පුද්ගලික වියදම් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ගෙවා තිබුණි. ඉහත වියදම් සැලකිය යුතු ප්‍රමාදයන් සහිතව ආපසු ගෙවා ඇති බව තවදුරටත් නිරීක්ෂණය විය. විස්තර පහත පරිදි වේ.

| බැරපත් ප්‍රකාශනයේ කාලපරිච්ඡේදය | අත්තිකාරම් ලබාගත් දිනය/ බැරපත් බිල්පත්‍ර නිරවුල් කළ දිනය | ආපසු ගෙවන ලද මුදල | ආපසු ගෙවන ලද දිනය | ප්‍රමාද කරන ලද දින ගණන |
|---|---|---|---|---|
| --------------------- | ------------------------ | ------------------- | ------------------ | -------------- |
| | | රු. | | |
| 31.03.15 – 30.04.15 | 21.05.15 | 31,166 | 08.06.15 | 18 |
| 30.04.15 – 31.05.15 | 23.06.15 | 42,450 | 10.07.15 | 17 |
| | | 25,511 | 22.09.15 | 91 |
| 31.05.15 – 30.06.15 | 27.07.15 | 38,048 | 18.08.15 | 22 |
| | | 194,660 | 22.09.15 | 57 |
| 30.06.15 – 31.07.15 | 25.08.15 | 775,124 | 22.09.15 | 28 |
| 31.07.15 – 31.08.15 | 22.09.15 | 517,007 | 24.11.15 | 63 |
| 31.08.15 – 30.09.15 | 15.10.15 | 450,000 | 07.12.15 | 53 |
| | | 185,766 | 08.12.15 | 54 |
| | | 1,801,616 | 26.04.16 | 194 |
| 30.09.15 – 31.10.15 | 24.11.15 | 553,934 | 18.01.16 | 55 |
| | | 24,193 | 27.01.16 | 64 |
| | | 14,191 | 29.02.16 | 97 |
| 31.10.15 – 30.11.15 | 15.12.15 | 1,053,993 | 04.03.16 | 80 |
| 30.11.15 – 31.12.15 | 19.01.16 | 856,700 | 04.03.16 | 45 |

### 3.4 ශ්‍රී ලංකාවේ රාජ්‍ය ණය කළමනාකරණය

රටේ ආර්ථික හා මිල ස්ථායීතාවය හා මූල්‍ය පද්ධතියේ ස්ථායීතාවය තහවුරු කර ගැනීමට ශ්‍රී ලංකා මහ බැංකුව ස්ථාපනය කරන ලදී. ශ්‍රී ලංකා රාජ්‍ය ණය කළමනාකරණය කිරීමේ නියෝජිත කාර්යය සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව වගකීම දරයි. රජයට අවම පිරිවැයක් යටතේ රජයට අවශ්‍ය මුදල් අවශ්‍යතාවයන් සම්පූර්ණ කර ගැනීමට භාණ්ඩාගාර සුරැකුම්පත් නිකුත් කිරීම සඳහා සුවිශේෂ වගකීමක්ද මහ බැංකුව විසින් දරනු ලැබේ.

2015 පෙබරවාරි සිට 2016 මැයි දක්වා කාල පරිච්ඡේදය තුළ ශ්‍රී ලංකා මහ බැංකුවේ රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව විසින් භාණ්ඩාගාර බැඳුම්කර නිකුත් කිරීම පිළිබඳව විශේෂ විගණන වාර්තාවක් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුවේ ගරු කථානායකතුමාට 2016 ජුනි 29 දින ඉදිරිපත් කරන ලදී. එම විශේෂ විගණන වාර්තාවේ ඇතුළත් නිරීක්ෂණ මෙම වාර්තාවේ නිරීක්ෂණ ලෙස සැලකිය යුතු වේ.

### 4. පද්ධති හා පාලන

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු බැංකුවේ අධිපතිවරයා වෙත වරින් වර යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් පිළිබඳව විශේෂ අවධානය යොමු විය යුතු වේ.

| | ක්ෂේත්‍රය | | නිරීක්ෂණ |
|---|---|---|---|
| | ----------- | | ------------ |
| (අ) | බැංකු නොවන මූල්‍ය ආයතන පිළිබඳ අධීක්ෂණය | - | ප්‍රාථමික ගනුදෙනුකරු විසින් රීති උල්ලංඝණය කිරීම |
| (ආ) | ගෙවීම් | - | ප්‍රතිපූර්ණය සඳහා විධිවිධාන නොමැතිව විදේශීය නීතිඥයින්ට හා උපදේශකවරුන්ට ගෙවීම් කිරීම |
| (ඇ) | අත්තිකාරම් නිරවුල් කිරීම | - | මුල් ඉන්වොයිසි නොමැතිව අත්තිකාරම් නිරවුල් කිරීම |